# ජූලියස් නියරේරේගේ චින්තනයෙන් ගම්‍ය වන දාර්ශනික මූලධර්ම

**එච්.එම්. සමරකෝන් බණ්ඩා**

විශ්ව දර්ශන ඉතිහාසය විමසා බලන විට ලෝක ප්‍රකට ජගත් කීර්තිධර ජන නායකයින්ගේ ක්‍රියා කලාපය තුළ ගැඹුරු දාර්ශනික චින්තනයක් ගැබ්වී තිබුණ බව ඒ පිළිබඳව විද්‍යාත්මක අධ්‍යයනයක් කරන විට පෙනීයයි. මේ සම්බන්ධයෙන් විමසා බලන විට ටැන්සේනියානු ජාතික ජූලියස් කුම්බරාග නියරේරේගේ (Julins Kambarage Nyerere) දේශපාලන සමාජ, ආර්ථික හා අධ්‍යාපනික ක්‍රියාකලාපය තුළින් දාර්ශනික සිද්ධාන්තයන් රැසක් ගම්‍ය වන බව පෙන්වා දිය හැකිය. විශේෂයෙන්ම සමාජවාදි දෘෂ්ටිකෝණයකින් දේශපාලන දර්ශනයක් ප්‍රවර්ධනය කළ (අබේපාල, 2019) මොහු ටැන්සානියාවේ අධ්‍යාපනය සංවර්ධනය කළ ආකාරය ද ප්‍රබල ආදර්ශයකි. ලෝක ප්‍රකට දාර්ශනිකයන් වන ප්ලේටෝ (Plato, 1952), ඩුවි (Dewey, 1953), රූසෝ (Rousseau, 1911), මාක්ස් (Marx), ගාන්ධි (Gandhi, 1951), තාගෝර් (Tagore, 1961) සහ රසල් (Russel, 1959) වැනි දාර්ශනිකයන්ගේ සෛද්ධාන්තික පදනමට ගැළපෙන ඒවාට නෑකම් ඇති දර්ශනයක පිහිටා ක්‍රියා කළ බව පැහැදිලි වේ. එම නිසා ජූලියස් නියරේරේ නම් වූ ටැන්සානියානු ජනාධිපතිවරයාගේ චින්තනය පිළිබඳ අධ්‍යයනය කිරීම හා සොයා බැලීමෙන් ගත හැකි දාර්ශනික ආදර්ශ බොහෝමයක් පවතින බව පෙන්වා දිය හැකිය.

## 1. ජූලියස් නියරේරේගේ ජීවිතය

ගුරුවරයෙකු වශයෙන් තම සමාජ සේවාව ආරම්භ කළ, ටැන්සානියාවේ ජනතාවගේ 98.1% ක ඡන්දය ලබාගෙන එරට පළමුවන ජනාධිපතිවරයා බවට පත් වූ නියරේරේ වේගවත් ගමනකින් සමාජ සේවයේ ඉහළ තලයට ගිය මිනිසෙකි. ඔහු මතවාදීව අප්‍රිකානු ජාතිවාදියෙකි. එමෙන්ම ස්කොට්ලන්තයේ එඩින්බර්ග් සරසවියෙන් තම උසස් අධ්‍යාපනය අවසන් කළ මොහු ගුරුවරයකු වශයෙන්

සේවය ඇරඹීය. මෙලෙස 1954 TAND දේශපාලන පක්ෂය පිහිටුවීමට මූලික වී ටැන්සානිකාව, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී පාලනයෙන් නිදහස් කර ගැනීමට කටයුතු කරන ලදී. 1960 මහමැතිවරණයේ දී තම පක්ෂය විශිෂ්ට ජයග්‍රහණයකට පත් කරමින් එරට අග්‍රාමාත්‍ය ධූරයට පත්විය. මෙලෙස 1961 ටැන්සානියාවට නිදහස ලබාගත් අතර 1962 දී ටැන්සානියාව ජනරජයක් බවට පත්කළ අතර එහි ප්‍රථම ජනාධිපතිවරයා බවට ද පත්විය.

ස්වකීය රට යටත් විජිත චින්තනයෙන් මුදා ගැනීමට ද අප්‍රිකානු ජාතිකයන් හා යුරෝපීය ජාතිකයන් අතර සමගිය වර්ධනය කිරීමට ඔහු මහත් කැපවීමෙන් කටයුතු කරන ලදී. එමෙන් ම 1964 දී ටැන්සානියාව සහ සැන්සිබාර් දේශය එක්ව ටැන්සානියාව බිහි වූ අතර එහි ජනාධිපති බවට ජූලියස් නියරේරේ තේරී පත්විය. මෙලෙස ඔහුගේම අත්දැකීම් හා චින්තනය පදනම්ව උජාමා (Ujama) යනුවෙන් ස්වකීය දේශපාලන දර්ශනය දියුණු කරන ලදී. මෙම දේශපාලන ප්‍රතිපත්තිය මත ක්‍රියා කිරීමේ දී මිනිසුන් තමන් ජීවත් වූ ප්‍රදේශවලින් ඉවත් කර වෙනත් තැන්වල පදිංචි කිරීම, විරුද්ධ දේශපාලන මතධාරීන්ට විරුද්ධව කටයුතු කිරීම, යනාදි ක්‍රියාමාර්ග නිසා, ඒවා යම් යම් අක්‍රමිකතා යැයි චෝදනා එල්ල වූ වාර අප්‍රමාණ වු බව සඳහන් කළ යුතුය. මෙලෙස ම යටත් විජිතවාදයට විරෝධය දැක්වූ නිර්භීත පාලකයෙක් ලෙස අප්‍රිකානු ජනතාව තුළ අදටත් ජූලියස් නියරේරේ අමරණීය නායකයෙක් බවට පත්වී ඇත. විශේෂයෙන් ම ටැන්සානියාව ඇතුළත අදත් හෙටත් ගෞරවයෙන් අනුස්මරණය කරන ජූලියස් නියරේරේ ගුරුතුමා යන ගරු නාමයෙන් මෙන්ම ජාතියේ පියා යන විරුධාවලියෙන් ද ගෞරවයට පාත්‍ර වේ. එම නිසා මෙම කීර්තිමත් ජන නායකයාගේ චින්තනයේ අන්තර්ගත වී ඇති දාර්ශනික අදහස් මෙතැන් සිට විමසීමට ලක් කිරීම වඩාත් කාලෝචිත වේ යැයි පැවසිය හැක.

**2. අවිහිංසාවාදය**

ජූලියස් නියරේරේගේ චින්තනය තුළ කැපී පෙනෙන ලක්ෂණයක් වුයේ අවිහිංසාවාදයයි. මෙම අවිහිංසාවාදය පෙරදිග කීර්තිමත් දාර්ශනිකයෙකු වන මහත්මා ගාන්ධිතුමාගේ දාර්ශනික

පර්යාලෝකයෙන් ලැබූ ආභාෂයක් බව පෙන්වා දිය හැකිය. එංගලන්තයේ නීතිය හැදෑරූ මහත්මා ගාන්ධි 1983 දී නීති වෘත්තියේ යෙදීමට අප්‍රිකාවට (Aggarwal, 2000: 235) ගියේය. එහි දී අවිහිංසාවාදී දර්ශනය (Gandhi, 1959) පිළිබඳ අදහස් අප්‍රිකානු සමාජය තුළ සංවර්ධනය වූ අතර පසුකාලීනව මෙම අදහස් ද ජූලියස් නියරේරේට (Bhatia, 1996) බලපා ඇති බව පෙන්වාදිය හැකිය. අවශේෂ රටවල් මෙන්ම ටැන්සානියාව ද බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙන් ගතින් සිතින් දෙකෙන්ම මහත් පීඩාවට පත් වී සිටීම මොහුට නොඉවසුම් සහගත කරුණක් විය. ඒ අනුව බ්‍රිතාන්‍ය බලධාරීන් සමඟ සාකච්ඡා කර නිදහස ලබාගැනීමට ක්‍රියාකරන ලදී. එහි දී අධිරාජ්‍යවාදී හිංසනයෙන් ජාතිය මුදා ගැනීමට ඔහු ක්‍රියාකිරීම මිනිසාගේ නිදහස ස්වාමීත්වය ස්වාධීනතාව, ප්‍රජාතාන්ත්‍රීය බව ඇති කිරීමේ දාර්ශනික චින්තනයක් සහිත ක්‍රියාමාර්ගයක් ලෙස අගය කළ හැකිය.

### 3. ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිපත්තිය

ප්‍රජාතන්ත්‍රවාදය (Democracy) සියලු දාර්ශනිකයන්ගේ අවධානයට යොමු වූ සංකල්පයකි. ප්‍රජාතන්ත්‍රවාදය යන වචනයෙන් ගෞරවය (Dignity), සමානත්වය (Equality), අන්‍යෝන්‍ය අවබෝධය (Mutual understanding), විවෘත මානසිකත්වය (Open mindedness), එකමුතු බව (Co:- Operation), අනෙක් අයට ගරු කිරීම (Respecting others), බලය (Adult franchise ), එකට වැඩ කිරීම (Yearning for living and working together) යනාදී විවිධ මානුෂික වටිනාකම් ඇති සංවර්ධනීය අගයයන් (Aggarwal 2003) රාශියක් අදහස් වේ. මෙහි දී ජූලියස් නියරේරේ, තම අරුෂා ප්‍රකාශනය (The arusha Declaration 1967:71) තුළින් ටැන්සානියාව තුළ ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී රාජ්‍යයක් ගොඩනැගීම සඳහා පක්ෂයේ කැපවීම ද විදේශ ආධාර මත යැපීම වෙනුවට ස්වශක්තියෙන් නැගී සිටීම ද අවධාරණය කර තිබේ. නියරේරේ අදහස් කළේ ලෝකයේ විවිධ ජාතීන්ගේ ආධාර, උපකාර, පරිත්‍යාග ලැබීමෙන් කිසිම දිනක ජාතියක් වශයෙන් නැගී සිටීමට නොහැකි බවයි. එමෙන්ම එමඟින්, සැබෑ නිදහසක් භුක්ති විඳීමට නොහැකි බවද ඔහු අවධාරණය කර තිබේ. ඒ අනුව මෙතැන් සිට රජයේ ප්‍රතිපත්ති සම්පාදනයේ දී ප්‍රධාන තැන ලබා දුන්නේ සමාජවාදය (Socialism) යන සංකල්පයට යි.

Tanu පක්ෂයෙහි විධායක සභාවේ සාකච්ඡාව සඳහා නියරේරේ සහභාගි විය. මෙහි දී මොහු විසින් පක්ෂයේ තම ප්‍රතිපත්ති ප්‍රකාශනයක් හඳුන්වා ඇත. එම දිනයට පසු දිනම තරමක් වේගවත් ස්වරූපයෙන් වුවත් ප්‍රජාතන්ත්‍රවාදී හා සමාජවාදී ප්‍රතිපත්ති වශයෙන් ටැන්සානියාව තුළ ක්‍රියාමාර්ග රැසක් නියරේරේ විසින් ප්‍රකාශයට පත් කරන ලදී. ඒවායින් කිහිපයක් පහත දැක්වේ.

i. සියලුම වාණිජ බැංකු ජනසතු කිරීම
ii. සියලුම වාණිජ බැංකු හිමියන්ට සාධාරණ ලෙස වන්දි ගෙවීම
iii. මහපරිමාණ බහු ජාතික ව්‍යාපාර ආයතනවල බහුතර අයිතිය රජය මිලදී ගනු ලබන බව මෙම කර්මාන්ත අතර විශේෂයෙන්ම සිමෙන්ති, දුම්වැටි, බීර, සහ ව්‍යාපාර නිෂ්පාදනය කරන සමාගම් වැදගත් වේ.
iv. මෙම කර්මාන්ත සඳහා ප්‍රමාණවත් දේශීය ශ්‍රමිකයන් පුහුණු කිරීම
v. මෙම ජනසතු කර්මාන්තවලට දේශීය ශ්‍රමිකයන් පුහුණු කර ගන්නා තුරු විදේශීය විශේෂඥයින්ගේ සහය ලබා ගැනීම
vi. සියලුම වාණිජ ගොඩනැගිලි මහල් නිවාස ජනසතු කිරීමට අවශ්‍ය විධිවිධාන සැලසීම
vii. අයිතිකරුවන් පදිංචි නොමැති නිවාස ජනසතු කිරීම
viii. රාජ්‍ය නායකයන් සහ පක්ෂයේ නිලතල හිමි අය විසින් පිළිපැදිය යුතු චර්යා ධර්ම පද්ධතියක් ප්‍රකාශයට පත් කිරීම
ix. පුද්ගලික සමාගම්වල කොටස් මිලදී ගැනීම හා අධ්‍යක්ෂධූර දැරීම තහනම් කිරීම
x. කුලියට දීම සඳහා නිවාස අයිති කර ගෙන සිටීම තහනම් කිරීම

ඉහත සඳහන් ක්‍රියාමාර්ග පිළිබඳ විමසා බැලීමේ දී පැහැදිලි වන්නේ නියරේරේ වඩාත් ආදර්ශවත් ප්‍රජාතන්ත්‍රවාදී පරිපාලන තන්ත්‍රයක් ගෙන යාමට දරන ලද උත්සහයයි. ප්‍රජාතන්ත්‍රවාදී පරිපාලන ක්‍රමයකදී රජය පළමුව ආදර්ශවත් විය යුතුය. ප්ලේගා සිය රිපබ්ලික් (Republic) එනම් සමූහාණ්ඩුව යන ග්‍රන්ථය ලියමින් රජය පරමාදර්ශී (Ideal state) වීමෙන් අනෙකුත් ජනතාව ඊට අනුකූලව හැසිරෙන (Taylor 1952, Peters 1967, Reid 1957) බවයි. මෙහි දී පළමුව නායකයින් පාලකයින් ආදර්ශවත් වීමෙන් සාධාරණය, යුක්ති සහගත බව, නීති ගරුක බව, විනයානුකූල පැවැත්ම, ප්‍රජාතන්ත්‍රවාදී බව (Dewey, 1922) ආරක්ෂා වන බව දාර්ශනික මතයයි. මේ නිසාම නියරේරේ ප්‍රජාතන්ත්‍රවාදය හා සත්‍යයට ගරු කිරීමක් වශයෙන් තමා සතුව තිබූ අමතර නිවෙස් විකුණා දමන ලදී. එපමණක් නොව තම බිරිද සතුව තිබූ කුකුළු ගොවිපළ සමූපකාර ග්‍රාමයකට පරිත්‍යාග කරණ ලදී. මෙයින් පැහැදිලි වන්නේ නියරේරේ කියනදේම කරන, කරනදේම කියන ආදර්ශවත් ප්‍රජාතන්ත්‍රවාදී මිනිසෙක් බවය. මෙය බෙහෙවින් දාර්ශනික චින්තනයක් සහිත ප්‍රජාතන්ත්‍රවාදී චර්යාවක් ලෙස අගය කිරීම වැදගත් වේ.

**4. උගත්කමේ කාර්යභාරය**

උගත්කම පිළිබඳ සහ උගත් චර්යාව සම්බන්ධව නියරේ දරන අදහස් බෙහෙවින්ම දාර්ශනික වේ. ඔහු පෙන්වා දෙන්නේ පුද්ගලයෙකුට අධ්‍යාපනය ලබා දෙන්නේ සමාජය විසින් වන හෙයින් ඉගෙන ගන්නා සෑම පුද්ගලයෙකුම එම සමාජයට ණය ගැතිය. ඔහු හෝ ඇය එම ණය ගෙවිය යුතු බවයි. නියරේරේ (1974) පෙන්වා දෙන්නේ ටැන්සානියාවේ ජනතාවට සේවය කිරීමට නම් තමන් ද සමාජයේම කොටසක් බව උගත් පිරිස් විසින් අවබෝධ කර ගත යුතු බවය. උගත්කම වඩාත් ඵලදායී තත්ත්වයකට පත්විය හැක්කේ තමන් වෙනස් කිරීමට ගන්නා උත්සහය, සමාජයේ ම පූර්ණ සාධාරණයක් බවට ඔවුන් ද පත් වූ විට පමණක් බවය. සිදු විය හැකි වාසනාව හෝ අවාසනාව යන දෙකම පිළිගැනීමට සූදානම්ව ඊටම කැපවූ විට පමණක් බව නියරේරේ තවදුරටත් අවධාරණය කරයි. නූතන සමාජය තුළ උගත්කම යන සංකල්පයෙන් කුමක් අදහස්වේද යන්න විමතිය දනවන යළි සොයා බැලිය යුතු (සන්නස්ගල, පුංචි බණ්ඩාර)

මාතෘකාවක් වී තිබෙන සමයකි. උගත්කමින් විය යුතු, කාර්යභාරය පිළිබඳ නියරේරේ ඉදිරිපත් කරන අදහස් සැබවින්ම දාර්ශනික පදනමක් සහිත බව පෙන්වා දිය හැකිය.

මේ අතර නියරේරේ (1974) උගත් පුද්ගලයෙකුගේ යුතුකම් හා වගකීම් පිළිබඳව දක්වන ලද අදහස් උපුටා දක්වන අබේපාල (2019) එය මෙලෙස ඉදිරිපත් කර තිබේ. ''අප අපගේ ට්‍රැක්ටරය තුළ ආයෝජනය කරන්නා සේම, අධ්‍යාපනය ලබා දීම මඟින් අප කරන්නේද පුද්ගලයෙකුගේ මොළය තුළ ආයෝජනය කිරීමකි. අපි අපගේ ට්‍රැක්ටරයෙන් අත් මුල්ලුවකට වඩා දහස්ගුණයක කාර්යයන් අපේක්ෂා කරමු. ඒ අයුරින්ම අධ්‍යාපනය ලැබීමේ වාසනාව නොලද පුද්ගලයාට වඩා සිය දහස් ගුණයක ප්‍රතිලාභ අධ්‍යාපනය ලද පුද්ගලයාගෙන් සමාජය බලාපොරොත්තු වෙයි. විශ්ව විද්‍යාලයේ සිටින ශිෂ්‍යයන්ට අප ප්‍රදානය කරන්නේ පරහිත කාමීත්වය හේතුවෙන් නොවේ. පසුව තවත් වැඩිපුර ලබා ගැනීමේ අපේක්ෂාවෙනි. දුප්පත් ජනයාට මූල්‍යමය වශයෙන් පරහිත කාමී විය නොහැකිය. විශ්ව විද්‍යාල උපාධිධාරීන් ගෙන් මෙන්ම අනෙකුත් සියලුම වර්ගයේ වෘත්තිකයන් ගෙන්ද බොහො දේ අපේක්ෂා කිරීමේ අයිතියක් අපට ඇත. අප තුළ පවතින්නේ හුදු බලාපොරොත්තුවක් නොවේ. අපේක්ෂාවකි.'' ජූලියස් නියරේරේගේ මෙම ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ උගත්කම පිළිබඳ ඔහු තුළ තිබූ ගැඹුරු දාර්ශනික පර්යාවලෝකයයි.

මේ අනුව බලන විට ජනනායකයෙක් ලෙස නියරේරේ උගත් මිනිසාගේ කාර්යභාරය පිළිබඳ දක්වන මෙම අදහස ඕනෑම රටකට ජාතියකට, දේශපාලනයකට, සාධාරණ වූ සමකාලීන වූ, වටිනාකමක් ඇත. උගතුන් තම රටට ජාතියට වැඩ කළ යුතුය. උගත්කම ලද මිනිස්සු ජාතියේ වටිනා සම්පතක්ය සහ සමාජ අපේක්ෂා ඉටු කළ යුතු පිරිසක්ය, යන අදහස සෑම රටකම උගතුන්ට ලබා දෙන ප්‍රබල ජාතික ආදර්ශයකි.

**5. අධ්‍යාපනයේ සමාජීය අදාළත්වය**

ඕනෑම රටක අධ්‍යාපනය සමාජයට අදාළවිය යුතු බව (Social Efficiency of education ) දාර්ශනිකයින් අවධාරණය කර ඇති සුවිශේෂ අදහසකි. ජූලියස් නියරේරේ පෙන්වා දෙන්නේ

අධ්‍යාපනයෙන් සමාජය සංවර්ධනය විය යුතු බවය. කාන්ස්ටන් (Carnston, 1991) ඩුවී (Dewey, 1916: 44) රසල් (Russel, 1962) යන දාර්ශනික අදහස්වලින්ද අවධාරණය කරන්නේ අධ්‍යාපනය සමාජයට අදාළ විය යුතු බවය. ජෝන් ඩුවී පෙන්වා දෙන්නේ සමාජ කාර්යක්ෂමතාව අධ්‍යයනයේ මූලික අරමුණක් (Social sfficieng as the aim of education) විය යුතු බවය. ඔහු පෙන්වා දෙන්නේ පාසල නමැති අධ්‍යාපන ආයතනය සමාජීය ආයතනයක් (School as a social institution) බවය. ඩුවී තම ග්‍රන්ථයක (In his book my pedagogic creed Dewey states) සඳහන් කරන්නේ (I believe that the school is primarily a social institution. Education being a social process. The school is simply that from of community life in which all those agencies are concentrated that will be most effective in bringing the child to share in the inherited resources of the race and to use his own powers of social ends.) පාසල සමාජීය ආයතනයක් බවත් සමාජීය ක්‍රියාවලියක් අධ්‍යයනය තුළ සිදුවන බවත්ය. මේ අනුව මෙවැනි දාර්ශනික පදනමක් සහිත අධ්‍යාපනයේ සමාජීය අදාළත්වය පිළිබඳ නියරේරේගේ සංකල්පයට මහත්මා ගාන්ධිගේ ජෝන් ඩුවීගේ දාර්ශනික අදහස් බෙහෙවින් බලපා තිබෙන බව සඳහන් කළ හැකිය.

නියරේරේ අධ්‍යාපනයෙන් සමාජය හැඩගැස්විය යුතු ආකාරය සහ අධ්‍යාපනය මඟින් මානව ශුභසිද්ධිය ඉටු විය යුතු ආකාරය පිළිබඳ සඳහන් කර තිබෙන අදහස් රෝලන්ඩ් අබේපාල (2019) තවදුරටත් මෙසේ දක්වයි. ''එනම් අධ්‍යාපනයෙන් සිදු විය යුත්තේ පොදු අරමුණක් සඳහා එකට ජීවත්වීමේ ඉලක්කයට අත දීමය. සියලු ම ජනයා තම ජීවිතයෙහි යහපත සඳහා එක හා සමානව දායක වන සමාජයක් ගොඩනැගීම සඳහා අපේ තරුණ ජනයා සූදානම් කිරීමට අධ්‍යාපනය සමත් විය යුතුය. අප අපේක්ෂා කරන පොදු අරමුණ වන්නේ මෝටර් රථ මහා මන්දිර සහ වෙනත් එවැනි දේ ගැනීම නොව මානව ශුභ සිද්ධියයි. එම නිසා අපගේ අධ්‍යාපනය මඟින් සිදුවිය යුත්තේ පොදු සමාජය වෙනුවෙන් කැපවීමේ හැඟීමක් පුද්ගලයා තුළ හට ගැන්වීමේ සහ අපගේ යටත් විජිත අතීතයට යෝග්‍ය වූ නොව වඩාත් හොඳ අනාගතයකට යෝග්‍ය වන ප්‍රමිතීන් පිළිගැන්මට සමාජය හැඩගැස්වීමය''. ජූලියස් නියරේරේ (1962) ටැන්සානියාවේ

අග්‍රාමාත්‍යවරයා වශයෙන් සිටියදී දක්වන ලද මෙම අදහස්වලින් පෙනී යන්නේ අධ්‍යාපනය සමාජ සංවර්ධනයේ ගාමක බලවේගයක් බව නියරේරේ තරයේ අවධාරණය කර ඇති බවයි.

නියරේරේ යට කී දාර්ශනික පර්යාවලෝකය ශ්‍රී ලංකාව ඇතුලු සෑම රටකටම ආදර්ශයක් සේ භාවිත කිරීම වැදගත් වේ. එහෙත් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන නව මඟ යන අධ්‍යාපනය හා සමාජ සංවර්ධනය අතර දුරස්ථ බව (නවමග, 1972ඃ 1) මෙසේ පෙන්වා දෙයි.

''නිදහස ලබා මෙතෙක් කල් ගෙවී ගිය ද අපේ අභිලාෂය අපේ ආකල්පය හා ඇගයීම් තවමත් වැඩෙනුයේ යටත් විජිත යුගයේ පැවති තත්ත්වයට වඩා වෙනස්ව නොවේ. වටිනාකම් පිළිබඳ හැඟීම්, නාස්තියටත්, පංති හැඟීමටත් තුඩු දෙන නිසරු ජීවන රටා අපේ ජාතික ආකල්පයන්ට වැදී සිටින තුමුල පිළිල බඳුය. එහෙත් ආගම ඉගැන්වීම අනිවාර්ය කොට තිබියදී ඒ මඟින් උසස් චරිත ලක්ෂණ සමාජය තුළ වැඩිය යුතුව තිබියද මෙබඳු නිසරු හැඟීම්වලින් පුහු ඇගයීම්වලින් පෝෂණය ලැබීමට පුරුදුව සිටින පුද්ගලයින් ගෙන් අප බලාපොරොත්තු වන නව සමාජයක් බිහි කළ හැකි නොවේ.''

ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ සමාජීය අදාළත්වය තුළ ඇති ගැටලුවලට ස්වභාවය ඉහත ප්‍රකාශයෙන් අවබෝධකර ගත හැකිය. එයින් පෙනී යන්නේ මෙරට අධ්‍යාපනය දර්ශනයෙන් කොතරම් දුරට ඈත්වී පවතිනවා ද යන්නයි. මීට සාපේක්ෂව බලන විට නියරේරේගේ අධ්‍යාපන සංකල්පය කොතරම් දුරට දාර්ශනික පදනමක් සහිත සමාජීය අදාළත්වයකින් යුක්ත දැයි අවබෝධකර ගත හැකිය.

තවද ජූලියස් නියරේරේ පෙන්වා දෙන පරිදි සමාජ යහපත රටේ ජීවත් වන තරුණ ජනයා අධ්‍යාපනයෙන් බලගැන් විය යුතුයි. මේ අදහස ප්ලේටෝ (Plato, 1952) පෙන්වා දෙන පරිදි (Vision of the virtue) යහපත පිළිබඳ දර්ශනය පිළිබිඹු කරයි. ආත්මාර්ථකාමිත්වයෙන් තොරව සමාජය වෙනුවෙන් කැපවීමට අධ්‍යාපනය මඟින් මිනිසා යොමු කළ යුතු බව නියරේරේ අවධාරණය කරයි. මෙම අදහස පොස්ටලොසි (Curtis and boultwood, 1963) පෙන්වා දෙන අධ්‍යාපනය සමාජ ප්‍රගතිය උදෙසා උපරිම මට්ටමින් කැපවීම අවශ්‍ය බව අවධාරණය කරන දාර්ශනික අදහස හා බෙහෙවින්ම එකඟය.

**6.ස්වශක්තියෙන් නැගී සිටීම**

ජූලියස් නියරේරේගේ අධ්‍යාපන චින්තනයේ වැදගත්ම දාර්ශනික ලක්ෂණය වන්නේ මිනිසාට ස්වශක්තියෙන් නැගී සිටීමට අධ්‍යාපනය අනුබලයක් විය යුතුය යන්නයි. නියරේරේ ස්වශක්තිය උදෙසා අධ්‍යාපනය Education for self reliance (ESR) යනුවෙන් අදහස් කළේ ටැන්සානියානු ජනතාවගේ සංවර්ධනය ඔවුන්ගේ රටේම සම්පත් අනුව පවතින්නක් විය යුතු බවයි. මෙම සංකල්පය මහත්මා ගාන්ධි, මාඕසේතුං, කාල්මාක්ස්, ඩුවී, රූසෝ අවධාරණය කළ දාර්ශනික සංකල්පයක් බව (අබේපාල, 2019) අවධාරණය කළ හැකිය. මෙම ස්වශක්ති සංකල්පය බුදුන්වහන්සේගේ අධ්‍යාපන දර්ශනය මීට ශතවර්ෂ ගණනාවකට පෙර මුලින්ම අවධාරණය (වීරසිංහ, 1999) කර තිබේ. ස්වශක්තිය පිළිබඳ අදහස් දක්වන කාල් රොජර්ස් (Rogers, 2004) පෙන්වා දෙන්නේ මානව විභවතාව හා ආත්ම සාක්ෂාත්කරණය පිළිබඳ හැකියාව (Human potential and self-actualization) සෑම පුද්ගලයෙකු තුළ පවතින බවයි. මෙම දාර්ශනික යතාර්ථය අවබෝධකර ගත් ජූලියස් නියරේරේ අදහස් කළේ තම රටේ සංවර්ධනය, පුද්ගල සංවර්ධනය, ජාතික විමුක්තිය, ස්වශක්තියෙන්ම ජයග්‍රහණය කිරීම අභිමානවත් බවය.

ස්වශක්තිය උදෙසා අධ්‍යාපනය මඟින් නියරේරේ අපේක්ෂා කළ අරමුණු (Tanzania Ministry of education, 1982) රාශියකි. එනම් අධ්‍යාපනය ලබන්නන් තුළ සමාජයමය ගැටලු නිරාකරණය කර ගත හැකි උසස් දැනුමක් (Knowledge) ඇති කිරීමයි. එම දැනුමින් පමණක් පොහොසත් වීම ප්‍රමාණවත් නොවන අතර ඒ සඳහා ස්වශක්තිය සංවර්ධනය කර ගැනීමේ කුසලතාවලින් (Skills) පරිපූර්ණ පිරිසක් බිහි කිරීමද අධ්‍යාපනයේ වගකීම විය යුතු බව නියරේරේ අවධාරණය කරන ලදී.

මේ අතර ඉගෙනුම්කරුවන් තුළ ස්වශක්තිය පිළිබඳ ආකල්ප (Attitudes) සංවර්ධනය කිරීමද අධ්‍යාපනයෙන් බලාපොරොත්තු විය. හුදෙක් නිශ්ක්‍රීය දැනුම් සම්භාරයකින් මනස පුරවනවා වෙනුවට සක්‍රීය ලෙසත් ප්‍රායෝගිකවත් ස්වශක්තිය වර්ධනය කිරීමට මග පෙන්වීම බෙහෙවින්ම දාර්ශනික හා මනෝවිද්‍යාත්මක මෙන්ම සමාජ

විද්‍යාත්මක සංකල්පයක් බව (Durkheim, 1956, Delamont, 1990, Coleman, 1976, Ellis Rogers, 1961) පෙන්වාදිය හැකිය. මේ අනුව සමාජමය ගැටලු නිරාකරණය කර ගැනීමේ හැකියාව අධ්‍යාපනයෙන් ලබාදීමට නියරේරේ ගත් පියවර දාර්ශනික වශයෙන් පොහොසත් අදහසකි.

මේ අතර ස්වශක්තිය උදෙසා අධ්‍යාපනය ලබාදීමෙන් ඔහු අදහස් කළ තවත් අරමුණක් වූයේ ප්‍රධාන වශයෙන්ම කෘෂිකාර්මික රටක් වූ ටැන්සේනියානු සමාජයෙහි අවශ්‍යතා සඳහා දේශයේ තරුණ තරුණියන් සූදානම් කිරීමයි. එවකට යටත් විජිතවාදි බොහෝ රටවල් ආර්ථික ස්වායත්තභාවය අහිමි කර ගෙන තිබුන අතර එම යටත් මානසිකත්වය තව දුරටත් රටවල පරිහානියට හේතු සාධක විය. මේ නිසා මෙම යටත් විජිතවාදී පරායත්ත මානසිකත්වයෙන් තරුණ ජනතාව මුදවා ගෙන දේශීය කෘෂිකර්මය නඟා සිටුවීමට උර දෙන තරුණ පිරිසක් අධ්‍යාපනයෙන් බිහිකර ගැනීම බෙහෙවින්ම අර්ථවත් අධ්‍යාපනයක දාර්ශනික මූලධර්මයකි. මේ අනුව ස්වශක්තිය උදෙසා අධ්‍යාපනය ලබා දීමෙන් ජූලියස් නියරේරේගේ දාර්ශනික පර්යාලෝකයේ ප්‍රතිඵල රාශියක් ඇත. ඒවා තව දුරටත් පහත දැක්විය හැකිය.

- ස්වශක්තියෙන් නැඟී සිටීමට අධ්‍යාපනය ලබා දීම ජාතික සම්ප්‍රදායක් බවට පත් කිරීම (TME, 1982)
- මිනිසාගේ ස්වාධීනතාව නිදහස ගරුකොට සැලකීම.
- ඕනෑම දෙයක් දරා ගැනීමේ ආත්ම ශක්තිය ඇති කිරීම.
- ජාතිය ගොඩනැඟීමේ ජාතික සංවර්ධනයේ ආත්ම විශ්වාසය හා ආත්ම ශක්තිය ඇති කිරීම.
- මානව ජීවියෙක් වශයෙන් ටැන්සානියානු ජනතාවගේ ආත්ම ගරුත්වය ආරක්ෂා කිරීම.
- ටැන්සානියානු දේශය තුළ ස්වශක්තිය පදනම් කරගත් ටැන්සානියානු සංස්කෘතියක් ගොඩනැඟීම. එයම ටැන්සානියානු සංවර්ධනයේ පදනම බවට පත් කිරීම.
- තමාගේම ස්ථාවරය සහතික කරගත් ටැන්සානියානු වැසියන් බිහි කිරීම.

- සෑම පුරවැසියකු තුළම විමර්ශනාත්මක වූත්, විවෘත වූත්, මානසිකත්වයක් ගොඩනැඟීම.
- සමාජ සංවර්ධනයට දායක වීමේ හැකියාව වර්ධනය කිරීම.
- අධ්‍යාපනයේ සමාජීය අදාළත්වය වැඩි කිරීම.
- අධ්‍යාපනය ජාතික සංවර්ධනයට අදාළ කර ගැනීම.
- ස්වශක්තියෙන් හෙබි කායික දුබලතාවක් නොමැති බුද්ධිමතුන් ද ඇතුළුව වැඩ කරන ජනතාවක් බිහි කිරීම.

නියරේරේගේ ඉහත සඳහන් ස්වශක්ති සංවර්ධන අභිප්‍රායයන් සලකා බලන විට ලෝක ප්‍රකට දාර්ශනික මත හා ඒවා සාකල්‍යයෙන්ම එකඟ වන බව පෙන්වාදිය හැකිය.

මේ අතර නියරේරේ (1962) පෙන්වා දෙන්නේ ''සමාජය තවමත් සිතන්නේ උගත් බුද්ධිමත් ජනයා දහඩිය හෙළා වැඩ කළ යුතු පුද්ගලයන් නොවන බවය. අපගේ තරුණියන් පවා නිවාඩු දිනවල විවේක සුවයෙන් ගත කළ යුතු බව අපගේ සමාජයෙහි ආකල්පයයි. තරුණ තරුණියන් දහඩිය වැගිරෙන අප්‍රායන්ත ‍රැකියාවන්හි නිරත වීම පවා සමාජය තවමත් අනුමත නොකරයි. එය අප විදේශිකයන් ගෙන් උපුටා ගත් ආකල්පයකි.'' ජූලියස් නියරේරේ ජනතා නායකයෙක් ලෙස ජාතික සංවර්ධනයට ඇති බාධා හොඳින් හඳුනා ගෙන තිබීම අගය කළ යුතුය. ඒ සමඟම ජාතියක් වශයෙන් සංවර්ධනය වීමේ මෙම අධ්‍යාපනය ස්වශක්ති වර්ධනයට යොමුකිරීමේ මනෝමූලික වූ දාර්ශනික සංකල්පය බල ගැන්වීම යටත් විජිතවාදී නොදියුණු අවශේෂ රටවලට ද මහඟු ආදර්ශයක් බව පෙන්වා දිය හැකිය.

### 7. වැඩ ලෝකය හා අධ්‍යාපනය අතර සම්බන්ධය

ජූලියස් නියරේරේ අවබෝධ කර ගත් වැදගත්ම දාර්ශනික සංකල්පය ලෙස සැලකිය හැක්කේ ලෝකය වෙනස්කරන ප්‍රධාන බලවේගය වන්නේ අධ්‍යාපනය පදනම් කරගත් වැඩ කිරීමේ කලාව බවය. නියරේරේ අවධානය කළ සුවිශේෂ කරුණ වන්නේ අධ්‍යාපනය මිනිසා වැඩ කිරීම දෙයට යොමු කරන හැඩ ගැසීමක් විය යුතුය යන්නයි. එපමණක් නොව එය සාක්ෂරතාව හා අවිද්‍යාව දුරු කිරීමට

සමන්විත යුතුය. ඒ සියල්ලටම වඩා රටෙහි ස්වභාවික සම්පත් තුළින් උපරිම ඵලය ලබා ගනිමින් එය ගොවි කම්කරු ආදී සියලුම ජනයාගේ යහපත වෙනුවෙන් යොදා ගැනීමේ හැකියාව ලබා දෙන අධ්‍යාපනයක් (අබේපාල, 2019) විය යුතුය. මෙම අදහස් තුළ ගැබ්ව ඇත්තේ දාර්ශනික මූලධර්ම සමූහයකි. අදවන විට දියුණු වෙමින් පවතින රටවල පවතින ප්‍රබලම ගැටලුවක් බවට පත්වී ඇත්තේ ද මෙයයි. රටක් සංවර්ධනයට පත්වන්නේ එහි ජනතාව අධ්‍යාපනය ලැබූ ප්‍රමාණය හා ගුණය අනුව පමණක් නොවේ. එසේ නම් රටක සංවර්ධනය තීරණය වන්නේ ජනතාව ලබාගත් දැනුම ආකල්ප කුසලතා ප්‍රමාණය හා ගුණය යොදාගෙන වැඩ කළ ප්‍රමාණය අනුවය. එම නිසා ග්‍රාමීය සංවර්ධනය නිෂ්පාදනය අරමුණු කරගෙන වැඩ කිරීමේ සංස්කෘතියක් ගොඩනැගීම නියරේරේගේ දර්ශනය විය.

වැඩ කිරීමට දිරිගන්වන වැඩ කරන සංස්කෘතියක් ගොඩ නැගීම සඳහා අධ්‍යාපනය යොමු කළ යුතුය, යන ඉහත නියරේරේගේ මතය දාර්ශනිකයින්ගේ ප්‍රමුඛ අවධානයට යොමු වූ තේමාවකි. මෙහිදී (Dewey, 1986; Dave, 1971; Govin, 1975; Musgrove, 1979; Rollings, 1979; Stenhouse, 1976; field, 1991) විශේෂඥයින්, පර්යේෂකයින් පෙන්වා දෙන පරිදි අධ්‍යාපනය තුළින් ප්‍රායෝගික කුසලතා වර්ධනය, ක්‍රියාකාරී අධ්‍යාපන කටයුතු, විෂය මාලාව වැඩ ලෝකය සමග සම්බන්ධ කිරීම, නිපුණතා සංවර්ධනය, වෘත්තීය කුසලතා වර්ධනය, වෘත්තීය කුසලතා වර්ධනය ඇති කිරීමෙන් වැඩ ලෝකයට (World of work) මිනිසුන් යොමු කළ හැකිය. මේ සඳහා නිසි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කළ යුතුය. සියලු දාර්ශනික මත සැලකිල්ලට ගෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කිරීමෙන් ඒවා ක්‍රියාවට නැගීමෙන් වැඩ ලෝකයට අදාළ ක්‍රියාශීලි ජනතාවක් බිහි කළ හැකි බව ද නියරේරේ වටහාගෙන ඊට ප්‍රමුඛත්වය දී ක්‍රියා කළ බව ද පෙනී යයි.

මෙම අදහස් වටහාගත් නියරේරේ වැඩ ලෝකයට මිනිසුන් පිවිසෙන අධ්‍යාපනික වෙනස්කම් රාශියක් ඇති කරන ලදී. ඒ අනුව අධ්‍යාපනය ගැමි ජීවිතය දෙසට යොමු කිරීම සිදු කරන ලදී. එයින් මහත්මා ගාන්ධි බලාපොරොත්තු වූ පරිදිම නියරේරේ ද ග්‍රාමීය සංවර්ධනය ඇතිකිරීම බලාපොරොත්තු විය. තව ද අධ්‍යාපන

ක්‍රියාවලියේ දී ගුරුවරුන් සහ ශිෂ්‍යයින් එක් වී නිෂ්පාදනශීලි ක්‍රියාකාරකම්හි නිරත වීමට යොමු කරන ලදී.

මෙහිදී මෙම ක්‍රියාකාරකම් තීරණය කිරීමේ දී සැලසුම් කිරීමේ දී සහ සංවිධානය කිරීමේ දී ශිෂ්‍යයන් ද සහභාගි කර ගැනීම අවශ්‍ය බව අවධාරණය කර තිබේ. මෙම ක්‍රියාමාර්ගය බෙහෙවින්ම ඩුවීගේ අත්දැකීම් පිළිබඳ දාර්ශනික න්‍යායට එකග වේ. වැඩකරමින් ඉගෙන ගැනීම (Working by learning), අත්දැකීම් මගින් ඉගෙනීම (Working by Explain) යන ඩුවීගේ හා රූසෝගේ අදහස් නියෝජනය කර තිබේ. විශේෂයෙන්ම කීල් පැට්‍රික් (1916) පෙන්වා දෙන්නේ මෙවැනි ක්‍රියාකාරී අධ්‍යාපනයක් තුළින් වැඩ ලෝකයේ මූලික කුසලතා ප්‍රගුණ කළ හැකි බවය.

මේ අතර නිෂ්පාදන ක්‍රියාකාරකම් පාසල් විෂය මාලාවේ අනිවාර්ය අංගයක් වීම ද අවධාරණය කර තිබේ. නියරේරේ මෙයින් අදහස් කර ඇත්තේ අධ්‍යාපනය නිෂ්පාදනය හා එක්ව වැදගත් අංගයක් බවට පත් කිරීමයි. වර්තමානයේ පවතින විභාග කේන්ද්‍රීය අධ්‍යාපනය නොසලකා ඇති බව පෙනී යයි. එය ටැන්සානියානු අධ්‍යාපනය සංවර්ධනය කිරීමට ගත් වැදගත් පියවරක් ලෙස සැලකිය හැකිය. මෙලෙසම වයස අවුරුදු 7 දී ළමයින් පාසල් අධ්‍යාපනය ආරම්භ කිරීම වැදගත් පියවරකි. මෙහි දී ඔවුන් පාසල් හැර යන වයස වන විට නිෂ්පාදනශීලි කාර්යයන්හි යෙදීමට තරම් ඔවුන් නිසි මේරීමකට පත්වනු ඇති බව විශ්වාස කරයි. එනම් අධ්‍යාපනයෙන් නිකමුන් බිහිකිරීම වැළැක්වීමට එය කදිම පියවරක් වශයෙන් සැලකිය හැකිය.

තවද ප්‍රාථමික අධ්‍යාපනය පරිපූර්ණභාවයට පත් කිරීමට පියවර ගන්නා ලදී. ඒ අනුව එය උසස් අධ්‍යාපනය සඳහා මාර්ගයක් කොට නොසලකන ලදී. එසේම ශිෂ්‍යයින් තුළ ආත්ම විශ්වාසය සහයෝගීතාව විචාරශීලි චින්තනය, සහ විමර්ශනශීලී මනසක් ඇති කිරීමට අවධානය යොමු කරන ලදී. මාරියා මොන්ටිසෝරි (Montessori, 1965; 1948; 1991) පෙන්වා දෙන පරිදි ප්‍රාථමික අධ්‍යාපන ක්‍රියාවලියේ දී බුද්ධිමය පුහුණුව මෙන්ම ඉන්ද්‍රීය පුහුණුව ලබාදීම වැදගත් වේ. මේ සම්බන්ධව නියරේරේ ප්‍රාථමික අධ්‍යාපනය

ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් බවට පත් කිරීමට ගත් උත්සහය ප්‍රශංසනීය වේ.

අනෙක් අතට අධ්‍යාපනය සහ වැඩ කිරීම යනු ජීවත් වීමේ අංග බව ද (නියරේරේ, 1973) උපතේ සිට මරණය දක්වා ම ඒවා අඛණ්ඩව සිදුවිය යුතු බව ද ඔහු අවධාරණය කරයි. එයින් ද පැහැදිලි වන්නේ ටැන්සියාවේ අධ්‍යාපන ක්‍රියාවලිය වැඩ කිරීම හා බද්ධ කිරීමට නියරේරේ අවධානය යොමු කර ඇති බවය.

## 8. ගැටලු නිරාකරණ සංකල්පය

දාර්ශනිකයින් අවධාරණය කරන්නේ අධ්‍යාපනය මුළුමනින්ම ගැටලු විසඳීමේ ක්‍රියාවලියක් ලෙසය. එසේ නම් අධ්‍යාපන ලාභියෙකුට තමා ජීවත් වන විට මුහුණ දෙන විවිධ ගැටලු විසඳීමේ හැකියාව තිබිය යුතුය. එසේම සමාජයේ, පරිසරයේ, ආයතනයේ, ශාරීරික, මානසික, තාක්ෂණික, ආර්ථික, පරිපාලන මූල්‍ය, නෛතික ආදී විවිධ ගැටලු විසඳීමේ හැකියාව අත්‍යවශ්‍යවේ. මේ නිසාම ළමයා ඉගෙන ගන්නා විට ගැටලු විසඳීමේ ක්‍රම (Problem solving methods) ඉගෙන ගැනීමටද අවස්ථා ලබාදීම වැදගත් වේ. රූසෝ (Rousseau, 1911) පෙන්වා දෙන්නේ ගැටලු සමඟ ළමයාට පොර බැදීමට අවස්ථාව සලසාදී ඒ මඟින් ලබන අත්දැකීමෙන් ඉගෙන ගැනීමට සැලැස්විය යුතු බවය. මේ අනුව ජූලියස් නියරේරේ ටැන්සානියානු අධ්‍යාපන ක්‍රමයෙන් අපේක්ෂා කළේ ගැටලු විසඳීමේ හැකියාව ඇති පුද්ගලයින් බිහි කිරීමයි. තමාගේ රටේ පවතින අධ්‍යාපන කවයෙන් සමාජයේ ගැටලු විසඳගත හැකි විය යුතුයි. එම කුසලතා වර්ධනය කර ගැනීමට අධ්‍යාපනය ප්‍රමාණවත් පරිදි දායක විය යුතුය.

ඉහත නියරේරේගේ අපේ කලාව පුළුල්ව විමසා බැලුවොත් රටක ස්වාධීනත්වය, ස්වශක්තිය, අනන්‍යතාව, විශිෂ්ටත්වය ආරක්ෂා කරන මූලධර්මයක් ලෙස එය සැලකිල්ලට ගත හැකිය. එනම් කිසියම් රටක පවතින ආර්ථික ගැටලු, සමාජ ගැටලු, සෞඛ්‍ය, ආරක්ෂාව, දේශපාලනය, තාක්ෂණය, අධ්‍යාපනය, පරිසරය, සන්නිවේදනය සහ වෙනත් ගැටලු එම රටේ ඒ පිළිබඳ විශේෂ දැනුම ලත් පිරිසට විසඳීමේ හැකියාවක් තිබිය යුතුය. එසේ නොමැතිව යටකී ක්ෂේත්‍ර ආශ්‍රිතව ආර්ථික පරිහානිය, ණය ගැතිකම, සම්පත් නාස්තිය, වංචා

දූෂණ හා අපරාද වැඩිවීම, විවිධ ලෙඩ රෝග වර්ධනය, අසමානතාව, දරිද්‍රබව දිනෙන් දින වැඩි වේ. එම අධ්‍යාපන ක්‍රමයෙන් බිහිවන විෂය විශේෂඥයින්ගේ සේවය ශූන්‍යත්වයට පත්වනු ඇත. එම අධ්‍යාපනයේ ප්‍රායෝගික ප්‍රතිඵලය හා උපයෝගීතාවය නිෂ්ඵල වී යනු ඇත. මේ නිසා අධ්‍යාපනය ගැටලු නිරාකරණය සඳහා යොමු විය යුතුය. නියරේරේගේ චින්තනය බෙහෙවින්ම දාර්ශනික නැඹුරුවක් සහිතය.

මේ පිළිබඳව අදහස් දක්වන කොහේන් (Cohen 1967: 200-201) පෙන්වා දෙන පරිදි රූසෝ තම එමිල් ග්‍රන්ථය (Emile) ඇසුරින් ගැටලු විසඳීමේ හැකියාව කෙසේ ඉගැන්විය යුතුද යන්න මෙසේ පැහැදිලි කරයි.

“ඔබේ ශිෂ්‍යයාට ස්වභාව දහම නිරීක්ෂණයට උගන්වන්න. එමගින් ඔහු තුළ කුතුහලය වර්ධනය වේ. එම කුතුහලය සම්පූර්ණ කිරීමට ඉක්මන් නොවන්න. ඔහුට ගැටලු ඉදිරිපත් කර ඒවා විසඳීමට අවස්ථාව දෙන්න. ඔහුට විද්‍යාව ඉගැන්වීම අවශ්‍ය නැත. ඔහුට අනාවරණය තුළින් ඉගෙනීමට ඉඩ හරින්න. ගුරුවරයා වශයෙන් ඔබ බලය පාවිච්චි කළ විට ඔහු විමසීම අත්හිටුවයි. ඔහු අන්‍යයන්ගේ චින්තනය අනුව ක්‍රියා කරන්නකු බවට පත් වේ. සංකේත නොව අදාළ ද්‍රව්‍ය භාවිත කරන්න”.

මේ අනුව නියරේරේ ඉහත දාර්ශනික මත පිළිබඳ මනා අවබෝධයක් ලබාගෙන අධ්‍යාපනය මගින් සමාජයක පවතින ගැටලුවලට විසඳුමක් අපේක්ෂා කිරීම වැදගත් කාරණයකි. ඔහු පෙන්වා දෙන පරිදි ජනතාව ගැටලු නිරාකරණය කරමින් සේවය කිරීමට නම් අධ්‍යාපනය මගින් විශේෂ කුසලතා සහ ශිල්පීය ක්‍රම පුහුණු කළ යුතුය. ඒ අතරම ගුණධර්ම වගා කිරීමට ද යහපත් පුරුදු ප්‍රගුණ කිරීමට ද හැකිවිය යුතුය. මෙම ගුණධර්ම නිසා ආගමික නැඹුරුව චිත්ත ධෛර්යය සත්‍යවාදී බව මනා පැවැත්ම ඉදිරි දැක්ම කළමනාකරණ කුසලතා, වර්ධනය කර ගැනීමට අධ්‍යාපනය රුකුලක් විය යුතුය. මේ නිසාම සමාජයේ පවතින ගැටලු විසඳා ගෙන සමාජයේ ප්‍රීතිදායක තත්ත්වය වර්ධනය කර ගත හැකිය.

තව ද මෙම ගැටලු විසඳීමේ හැකියාව අධ්‍යාපන ක්‍රමයෙන් පෝෂණය කරන්නේ නම් පුද්ගලයා තුළ කුතුහලය පෞරුෂ

වර්ධනය, විමර්ශනය, විශ්ලේෂණය, චින්තනය, ඉගෙනීමේ පුරුදු, ස්ව සංකල්පය (Self concept), ස්වාභාවික බව, විනිශ්චය හැකියාව, සමාජානුයෝජනය, ආතතිය අඩුවීම, කාංසාව අඩුවීම, ධෛර්යය, ආකල්ප වර්ධනය, තාක්ෂණික වර්ධනය අත්හදා බැලීම, ගවේෂණය, පර්යේෂණය හා නිර්භීතකම මෙන්ම පෙළඹවීම ආදී විවිධ ගුණාංග සංවර්ධනය වේ. මෙම කරුණු සලකා බලන විට නියරේරේ විසින් අපේක්ෂා කළ අධ්‍යාපනය මගින් ගැටලු විසඳීමේ අවශ්‍යතාව බොහෝ රටවලට ආදර්ශමත් ප්‍රවේශයක් ලෙසින් සැලකිය හැකිය.

**9. වැඩිහිටි අධ්‍යාපනය**

වැඩිහිටි අධ්‍යාපනය, ලෝක ප්‍රකට අධ්‍යාපන සංකල්පයක් බව පෙන්වා දිය හැකිය. ජූලියස් නියරේරේ වැඩිහිටි අධ්‍යාපනය (Adult education) නිර්වචනය කර තිබෙන්නේ තමන් විසින් තමන්ටම උපකාර කරගත හැකිවන අන්දමට මිනිසුන්ට උදවු කිරීම ලෙසය. එමෙන්ම එය ජීවිතයෙන් වෙන් කළ නොහැකි එහිම කොටසක් ලෙසය. මොහු තව දුරටත් පෙන්වා දෙන්නේ වැඩිහිටි අධ්‍යාපනය, යාවජීව (Life long education) අධ්‍යාපනයක් ලෙස මිනිසාගේ විමුක්තිය උදෙසා ඉගෙන ගන්නා බවය. වැඩිහිටි අධ්‍යාපනය ජාතික සංවර්ධනයට (Adult education and national development) ප්‍රබල සම්බන්ධතාවක් සඳහා රුකුලක් ලැබෙන බව පිළිගත් නියරේරේ එය තම අධ්‍යාපන ක්‍රමය තුළ සංවර්ධනය කිරීමට උත්සහ කිරීම සමාජ සංවර්ධන උදෙසා ගත් දාර්ශනික ප්‍රයත්නයක් බව පෙන්වා දිය හැකිය.

මෙලෙස වැඩිහිටි අධ්‍යාපනය පිළිබඳ අදහස් දක්වන තවත් වාර්තාවක් (Unesco, 1974) පෙන්වා දෙන්නේ සෑම ආකාරයෙන්ම සමාජයේ සංවර්ධනයට මෙම වැඩිහිටි අධ්‍යාපනය අදාළ වන බවය. එනම් (The term adult education denotes the entire body of organized educational processes, whatever content, level and method whether formal or other wise, whether they prolog or replace initial education in schools, colleges and university as well as in apprenticeship, whereby persons regarded as adult by the social to which they belong develop their abilities, enrich their knowledge, improve their technical or professional qualifications

and bring about changes in their attitude or behavior in the two-fold perspective of full personal development and participation in balance and independent social economic and cultural development) වැඩිහිටියන්ගේ දැනුම කුසලතා, ආකල්ප, වෘත්තීය කුසලතාවන්, පෞරුෂය, සමාජ ආර්ථික සංවර්ධනය, තුලනාත්මක ක්‍රම ඇති කිරීමටත්, සමාජ සංවිධානයටත් බෙහෙවින්ම වැදගත් වන බවය. ඒ අනුව දාර්ශනිකයන් අනුමත කළ, ප්‍රකාශ කළ, සුවිශේෂ අධ්‍යාපනයක් ලෙස මෙම වැඩිහිටි අධ්‍යාපනය හඳුන්වා දිය හැකිය. ජූලියස් නියරේරේ මෙම සංකල්පය යාවජීව අධ්‍යාපනයත් සමඟ ඉදිරියට සංවර්ධනය කිරීමට උත්සහ ගනු ලැබුවේ එය ඒ තරමට සමාජ හා ජාතික සංවර්ධනයට වැදගත් බැවිනි.

තව ද ජූලියස් නියරේරේගේ මතයට අනුව වැඩිහිටි අධ්‍යාපනයේ දී ඉටු විය යුතු කාර්යයන් දෙකක් (අබේපාල, 2019) පෙන්වා දෙයි. එනම් වැඩිහිටියන් තුළ වෙනසක් ඇතිකර ගැනීමේ ආශාවක් ඇතිකිරීම සහ වෙනසක් ඇතිකර ගැනීම දුෂ්කර කාර්යයක් නොවන බවට අවබෝධයක් ලබා දීමයි. යම්කිසි ආකාරයකින් මෙම කරුණු දෙක ඔවුන් තුළ ඇති නොවුනහොත් වැඩිහිටි අධ්‍යාපනය ලැබීම අසාර්ථක වනු ඇත. එම නිසා වැඩිහිටි අධ්‍යාපනයට පෙළඹවීමේ මෙම මනෝ මූලික සාධක දෙක ඕනෑම වැඩිහිටියෙකුටම සාධාරණ වේ. තව ද තමන් වෙනුවෙන් තමන්ට තීරණ ගැනීමට ද එම තීරණ ක්‍රියාත්මක කිරීමට මිනිසුන්ට උදව්වීම ද කළ යුතුය. ඊට හේතුව මිනිසාට විමුක්තිය අත්කර ගත හැක්කේ ද සංවර්ධනය කරගත හැක්කේ ද තමන් විසින්ම වීමයි. ඔහුට විමුක්තිය සංවර්ධනය, අත්කර දීමට අනෙකුත් කවරෙකු හෝ කළ හැකි දෙයක් නොවේ. මෙයින් පැහැදිලි වන්නේ වැඩිහිටි අධ්‍යාපනය තමන් විසින් සංවර්ධනය වීමට මිනිසාට උදවු කිරීමේ ක්‍රියාවලියක් බවය. මෙහිදී අග්‍රාවල්, (Aggrawal, 2003) පෙන්වා දෙන්නේ සමාජයේ සාමාජිකයෙක් වශයෙන් හා දෙමව්පියෙක් වශයෙන් වගකිව යුතු පුරවැසියෙකු ලෙස අවශ්‍ය පරිදි ඉගෙනගත හැකි බවයි. එනම් (Adult education should enable everyone to study his or her role as a parent and member of a community as a wage earner and as a responsible citicen. it must also give opportunities for vocational employment) පූර්ණ නිදහසේ තම අපේක්ෂාව පරිදි අවස්ථා අත්පත් කර ගැනීමට ද මෙහි

දී හැකියාවක් ලැබේ. විශේෂයෙන්ම මෙහි දී නියරේරේ පෙන්වා දෙන්නේ විද්‍යාවේ හා පරායත්ත භාවයෙන් තහංචිවලින් මිනිසා මුදවා ගෙන විද්‍යාවේ හා ස්වායත්තභාවයේ දොරටු විවෘත කර ගැනීමට මග පෙන්වීමය.

මෙලෙස ජූලියස් නියරේරේගේ අදහස් හා ක්‍රියාකලාපය විමසා බලන විට ඔහු දාර්ශනික අදහස් උදහස්වලට ගැළපෙන පරිදි කටයුතු කර තිබෙන බව පෙනී යයි. අදටත් ටැන්සානියාවේ ජූලියස් නියරේරේ නාමය ගෞරව බහුමානයට පත් වේ. එරට ජාතියේ පියා යන විරුදාවලියෙන් පිදුම් ලබන ජූලියස් නියරේරේගේ ආර්ථික, සමාජ, දේශපාලන, අධ්‍යාපනික කටයුතුවලින් උසස් දාර්ශනික චින්තනයක් පිළිබිඹුවන බව මේ අනුව පෙන්වා දිය හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අබේපාල, රෝලන්ඩ් (2019). *අධ්‍යාපන දර්ශනයේ පෙරදිග චින්තන පැතිකඩ.* කොට්ටාවඃ සාර ප්‍රකාශන.

ජාතික අධ්‍යාපන ආයතනය (1989). *අධ්‍යාපනයේ දාර්ශනික පදනම.* මහරගමඃ ගුරු අධ්‍යාපන ආයතනය, ජාතික අධ්‍යාපන ආයතනය.

වීරසිංහ, හෙන්රි (1992). *අධ්‍යාපන චින්තනය.* නුගේගොඩඃ ක්ලැසික් ප්‍රින්ටර්ස්

සර්දාර් කේ. එම්. පනික්කාර් (1963). *ආසියා, අප්‍රිකා රාජ්‍ය ප්‍රශ්න.* කොළඹඃ ලේක්හවුස්.

Aggarwal J.C. (2005). *Principles, Methods, & Technigues, of Teaching*. vikas Publishing House Pvt Ltd.

Aggrawal, J.C. (2003). *Teachers and Educaiton in a Developing Society*. Vikas Publishing Hous Pvt. Ltd.

Bhatia, K.K. (1993). *Principles of education*. Ludhana: Kalyani Publishers.

Boyd, Willam (1967). *Plato;s Republic for today*. Londan.

Carnson, M. (1991). *The noble savage Jean Jacgues Roussean*. Chicago: University of Chicago.

Darling, john (1994). *Childcentred Education and its critics*. London: Paul chanpman publishing Ltd.

Dewey, J. (1953). *Experience and education*. New York: Macmillan.

Gandhi, M.K. (1959). *Non- violence, in to students*. (ed) Barathan Kumarappan, as quoted in young india. Ahamadabad: Navajivan publishing.

Gandhi, M.K. (1951). *Basic education*. Ahamadabad: Navajiovan Publishing House.

Jagore, R. (1961). *Pioneer in education*. London: John murray.

Kilpatrick, W.H. (1916). *Froebels Kindergarden Principles critically examined.* New York: Macmillan.

Lee H.D.P. (1965). (ed) *Plato : The Republic*. London: Penguin.

Montessori, M.(1965). *Spontaneous activity in education*. (Trans) Medermott. J.J. New York: Sehocken books.

Musgrave. P.W. *The Sociology of education* Third edition, New York: prublished in the U.S.A. by Methuen and co.

Neeta, Arosha, (2010). *Educational philosopy.* Saurahh publishing House.

Plato (1952). *Laws 11*. (trans) Bury. R.G. London: Henemann.

Rousseau, I.J. (1911). *Emile*, (Trans) Foxly, B. London:

Rousseau, J.J. (1962). *Emile*, (Trans) Foxly B. New York: Eveyman.

Rusk, R.R. (1962). *The doctrines of great educators*. London: Macmillan.

Taneja, V.R. (1990). *Sociao Philosophical approach to education*. New Delhi: Atlantic publishers & Distributors.